ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ

# කලා සඟරාව

සංස්කාරකවරු:

තෙරිපැහැ සෝමානන්ද
ආනන්ද කුලසූරිය
ඩී. එම්. ගුණරත්න

43 වන
කලාපය
1992 දෙසැම්බර්

# සීගිරි චිත්‍රවල විෂයක්ෂේත්‍රය පිළිබඳ සමාලෝචනයක්

අනුර මනතුංග

සීගිරි චිත්‍රවල විෂයක්ෂේත්‍රය බෙහෙවින් සාකච්ඡාවට බඳුන් වූ විවාදපන්න මාතෘකාවකි. සීගිරි චිත්‍රවලට විෂය වූ ස්ත්‍රීන් කවුරුන් ද ? එම ස්ත්‍රීන් නියැලී සිටින කාර්යය සහ අවස්ථාව කුමක් ද? මේ ස්ත්‍රීන් එහි චිත්‍රණය කළේ කුමන හේතුවක් නිසා ද? යන ප්‍රශ්නවලට පිළිතුරු ලෙස විවිධාකාර අර්ථ නිරූපණයන් ඉදිරිපත් වී ඇත. විවිධ විද්වතුන් විසින් නොයෙකුත් තැන පළ කරන ලද එකී අදහස් කැටි කොට දැක්වීම මේ ලිපියේ අරමුණ යි.

නූතන විද්වතුන් අතරින් මේ පිළිබඳ ව මුල් වරට දීර්ඝ ලෙස කරුණු දක්වා ඇත්තේ එච්. සී. පී. බෙල් ය. සීගිරියට සැතැපුමක් පමණ උතුරින් පිහිටි පිදුරංගල වෙහෙර බලා වන්දනාවේ යන කාශ්‍යප රජුගේ බිසවුන් සහ කුමරියන් මේ චිත්‍රවලින් නිරූපණය වන බව ඔහු සඳහන් කොට ඇත. මෙහි ඇති සියලු ම ස්ත්‍රීරූප උතුරට සංචරණය වන ලෙස දක්වා තිබීමත්, එම ස්ත්‍රීන් අත මල් දක්නට ලැබීමත් මීට සාධක ලෙස බෙල් සලකා ඇත. මේ ස්ත්‍රීරූපවල යටි අර්ධය වලාපටලයකින් වසා දමා තිබීමෙන්, මේවාට දේවත්වයක් ආරෝපණය කළ හැකි බව ඔහු සඳහන් කරතත්, එය එසේ යොදන්නට ඇත්තේ, සම්පූර්ණ ස්ත්‍රීරූපය ම විකෘතියකින් තොර ව පර්වත කෙවණිය තුළ චිත්‍රණය කිරීමේ අපහසුතාව නිසා ය යන්න ඔහුගේ පිළිගැනීම විය. මේ ස්ත්‍රීරූපවලට සැබෑ රාජ සභා ස්ත්‍රීන් ම විෂය වන්නට ඇති බව විශ්වාස කළ බෙල්, ඒ අතරින් කීප දෙනෙකු හඳුනා ගැනීමට ද උත්සාහ දරා ඇත. ඒ අනුව චිත්‍ර කෙවණියේ දකුණු කෙළවරේ ම සිටින මහලු ස්ත්‍රිය කාශ්‍යප රජුගේ මව විය හැකි බවත්, ඇය ශෝකාකුල ව සිටින්නේ සිය සැමියාට (ධාතුසේනට) මුහුණ පෑමට සිදු වූ අවාසනාවන්ත ඉරණම නිසා විය හැකි බවත්, බෙල් අනුමාන කර ඇත. තවද මෙහි ඇති වෙනත් ස්ත්‍රීරූපයක් වයස අවුරුදු දහතක පමණ තරුණියක ලෙස දකින බෙල්, ඇය කාශ්‍යප රජුගේ දියණියක විය හැකි බවත්, ඒ අසල ම සිටින අනෙක් තැනැත්තිය ඇගේ මව (කාශ්‍යපගේ බිරිඳක්) ලෙසත් හඳුනාගැනීමට ප්‍රයත්න දරා ඇත.

බෙල්ගේ මෙකී අදහස්වල හරය **වින්සන්ට් ස්මිත්**[2] සහ **ජෙරාල්ඩ් ජෝශප්**[3] ද පිළිගත් බව ඔවුන්ගේ ලියවිලිවලින් පැහැදිලි වේ. මේ ස්ත්‍රීන් කාශ්‍යප රජුගේ බිසවුන් සහ සේවිකාවන් බව කියන **ඊ. බී. හැවල්**[4] එම රූප සමඟ වලාකුළු යෙදීමෙන් පෙනෙන්නේ ඔවුන් තුසිත දෙව්ලොව බලා වන්දනාවේ යාමකැ යි සඳහන් කරයි.

**ආනන්ද කුමාරස්වාමිගේ**[5] අදහස මේ චිත්‍රවලින් අප්සරාවන් නිරූපණය වන බව යි. තත්කාලීන චිත්‍රවල අප්සරාවන් නිරූපණය වන සෑම විට ම සම්මතයක් ලෙස වලාකුළු යොදන බව පෙන්වා දෙන ඔහු, මේ චිත්‍රවල යටි අර්ධය වලාපටලයකින් වසා දමා ඇත්තේ ඔවුන් අප්සරාවන් නිරූපණය කරන නිසා යැ යි සඳහන් කරයි. අප්සරා රූප ලෙන්වල චිත්‍රණය කිරීම ආසියාව පුරා පැතිර ගිය පොදු ලක්ෂණයක් බව ඔහු පෙන්වා දෙයි. පසුව, තවදුරටත් මේ අදහස වර්ධනය කළ කුමාරස්වාමි, සීගිරි චිත්‍රවලින් දැක්වෙන්නේ මල්වැසි වස්වන අප්සරාවන් සහ ඔවුන්ගේ පරිචාරිකාවන් බව කියයි.[6] ඔහුගේ තවත් වාර්තාවක මේ පිළිබඳ ව සඳහන් වන්නේ මොවුහු "මල් බඳුන් ගත්, පරිවාර ස්ත්‍රීන් සහිත කුමාරිකාවන්ගේ වේශයෙන් ඇන්ද වූ අප්සරාවෝ" බව යි.